මගේ අංකය NP/07/10/04/35
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
උතුරු පළාත.
20.12.2017

**ප්‍රධාන ලේකම්,**
ආණ්ඩුකාර ලේකම්,
අමාත්‍යංශ ලේකම්වරුන්,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
**උතුරු පළාත.**

**උතුරු පළාත් කළමනාකරණ සහකාර සේවයේ අධි ශ්‍රේණියට උසස් කිරීමේ සීමිත තරඟ විභාගය - 2017**

---

2017 වර්ෂයේ ඔක්තෝබර් මස උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 28/2017 හි ප්‍රසිද්ධ කරන ලද "උතුරු පළාත් කළමනාකරණ සහකාර සේවයේ අධි ශ්‍රේණියට උසස් කිරීමේ සීමිත තරඟ විභාගය - 2017" විභාග දැන්වීමේ 4 වන ඡේදයේ පළමු වගන්තිය, ඡේද 6 හා 7 (ආ) යන ඡේදයෙහි අයදුම්පත් කැඳවන අවසාන දිනය පහත සඳහන් පරිදි සංශෝධනය කෙරේ.

(i) 4 වන ඡේදයේ පළමු වගන්තිය පමණක් පහත සඳහන් පරිදි සංශෝධනය කර ඇත.

2017.12.31 වැනි දිනැති අධි ශ්‍රේණියේ පුරප්පාඩු අතුරින් 50% ක පමණ පත්වීම් ලබාදීම, සීමිත තරඟ විභාග ප්‍රතිඵල මත වන අතර, ඒ අනුව ඉහත විභාගය මගින් සම්පූර්ණ කරනු ලබන පුරප්පාඩු සංඛ්‍යාව 18 කි.

(ii) 6 වන ඡේදයට පහත සඳහන් කරුණු ඇතුළත් කරනු ලැබේ.

(i) සටහන :
උතුරු පළාත් කළමනාකරණ සේවයේ දැනට සේවයේ නියුතු ශ්‍රේණිවලට ඉහත (අ), (ආ), (ඉ) මගින් දක්වා ඇති සක්‍රිය සේවා කාලය සම්පූර්ණ කර, මේවන විට රැඳී සිටින ශ්‍රේණියට අදාළව සමත් විය යුතු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය ව්‍යාවස්ථා විධිවිධාන අනුව ප්‍රකාර සම්පූර්ණ කළ යුතු අවම වාර ගණන 2017.12.31 දින සමත් වී තිබුණ ද, පරිපාලන හේතු නිසා අදාළ කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා සහන ලැබීමේ දී ඇති වූ පමාව, සේවා ස්ථිර කිරීම හෝ උසස් කිරීම් යනාදි ඉල්ලුම්පත් කැඳවන අවසාන දිනට අභිමිවීමේ හේතුව මත පමණක් සතුටුදායක සේවා කාලය සම්පූර්ණ කිරීමට නොහැකි වූ නිලධාරීන්ට ද මෙම විභාගයට අයදුම් කළ හැකියි.

(ii) සටහන :

කෙසේ වුව ද එම නිලධාරීන් අයදුම් කිරීමට හා විභාගයට පෙනී සිටීමට අවස්ථාව ලබා දීමට නම්, උසස්වීම් ලැබීමට සුදුසුකමක් නොවන බැවින් අතිවිශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ ලිපිය ලබාදීමට නිසිපරිදි උතුරු පළාත් කළමනාකරණ සහකාර සේවයේ සතුටුදායක සේවා කාලයක් සපුරා ඇති බවට සෑහීමකට පත්වී අදාළ ස්ථිර කිරීම් හා උසස් කිරීම් උපයා ගත යුතුයි.

(iii) 7(ආ) වැනි ඡේදයේ අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2017.12.31 දක්වා දීර්ඝ කර ඇත. ඒ අනුව ඉල්ලුම්කරු විසින් 2017.12.31 වන දිනට සුදුසුකම් සියල්ල සම්පූර්ණ කර තිබිය යුතුයි.

(iv) මෙම විභාගය සඳහා මේවන විට අයදුම් කර ඇති ඉල්ලුම්කරුවන් නැවත අයදුම්පත් යොමු කිරීමෙන් වළකින ලෙස දන්වා සිටිමි.

“ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ 2017.12.15 වන දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ගැසට් නිවේදනය සමගාමී කර ගෙන මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ”

සී.එ් මෝහන්රාස්,
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු පළාත.